# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| DSD/HO/02/Admin/01/Circular | ...................................... | 2021.12.06 |

සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂවරුන්වෙත.

**<u>2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ 44 (ඉ) II වගන්තිය යටතේ මනාපය පල කළ නිලධාරින් වැන්දඹු වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා දායකවීම සම්බන්ධවයි.</u>**

ඉහත කරුණට අදාළව ඔබ වෙත යොමු කරන ලද මගේ සමාංක හා 2021.11.09 දිනැති ලිපිය හා බැඳේ.

02. එම ලිපිය මඟින් දැනුම් දී ඇති පරිදි සමෘද්ධි පනතේ 44 (ඉ) II වගන්තිය යටතේ මුල් සේවා කාලය සමඟ විශ්‍රාම වැටුප් සහිත සේවකයන් ලෙස මනාපය පල කළ නිලධාරින් වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි වීම සඳහා ඔවුන් අධිකාරියේ පත්වීම් ලද දින සිට 2014.01.03 දින දක්වා වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිඟ දායක මුදල් ගෙවා අවසන් කළ යුතුව ඇත.

03. 2019.04.04 දිනැති 03/2019 දෙපාර්තමේන්තු අභ්‍යන්තර චක්‍රලේඛය නිකුත් කිරීමට පෙර හිඟ දායක මුදල් ගෙවා අවසන් කර ඇති නිලධාරින් ද මේ දක්වා වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි වී නොමැති බව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති තොරතුරුවලට අනුව නිරීක්ෂණය වේ.

04. 2019.04.04 දිනැතිව නිකුත් කළ 03/2019 අභ්‍යන්තර චක්‍රලේඛයට අනුව මුල් සේවා කාලය සමඟ විශ්‍රාම වැටුප් සේවකයන් ලෙස මනාපය වෙනස් කළ නිලධාරින් සඳහා ද මේ වන විට විධිමත් පත්වීම් ලිපි නිකුත් කර ඇත. ඒ අනුව, එම නිලධාරින් ද වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි විය යුතුය.

05. ඉහත 03 හා 04 ඡේදවල සඳහන් නිලධාරින්ගේ හිඟ දායක මුදල කොපමණ ද යන්න ගණනය කර එම මුදල අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හෝ දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ සමෘද්ධි නිල ගිණුම වෙත තැන්පත් කිරීමට කටයුතු කරන ලෙසත්, ඉන් පසුව වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි විය යුතු බවත් අදාළ නිලධාරින් දැනුවත් කළ යුතු අතර, දැනටමත් එම මුදල් ගෙවා ඇති නිලධාරින් මෙතෙක් වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි වී නොමැතිනම් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු වේ.

06. එමෙන්ම 2014.01.03 දින සිට පනතේ 44 (ඉ) III වගන්තිය යටතේ මනාපය පල කරන ලද නිලධාරින් ද මෙතෙක් වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි වී නොමැතිනම් ඔවුන්ගේ ලියාපදිංචි කිරීම් ද කඩිනම් කළ යුතුය.

07. ඉහත සඳහන් පරිදි කටයුතු කිරීම අත්‍යවශ්‍ය හා ප්‍රමුඛ කටයුත්තක් වන බැවින් සුදුසු ක්‍රමවේදයක් යොදාගනිමින් හා අතිරේක කාර්ය මණ්ඩලයක් අවශ්‍ය වන්නේ නම් සුදුසු නිලධාරින් අනුයුක්ත කර ගනිමින් මෙම කාර්යය 2021.12.31 දිනට පෙර නිම කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

08. මෙම කරුණ හා සමගාමීව සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ ශ්‍රේණි උසස්වීම් කඩිනමින් කිරීම අවශ්‍ය වන බව ද වැඩිදුරටත් දන්වා සිටිමි. මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රධාන ගණකාධිකාරි වෙතින් ගෙන්වා ගැනීමට කටයුතු කරන්නේ නම් මැනවි.

එම්.ඒ.එම්. ආරිෆා, අත්. කලේ:- ආර්.පී.බී. තිලකසිරි,<br>
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන). අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්:-

1. ලේකම්, සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මුල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. විගණකාධිපති - කා.දැ.ගැ.ස.
3. අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
4. අධ්‍යක්ෂ (පාලන) / අධ්‍යක්ෂ (ආයතන) - නිලධාරින් දැනුවත් කිරීම සඳහා
5. ප්‍රධාන ගණකාධිකාරි - දැ.ගැ.ස. හා අ.ක.ස.
6. ප්‍රධාන අභ්‍යන්තර විගණක - දැ.ගැ.ස.